මන්නාරම නගර සභාව
මන්නාරම දිස්ත්‍රික්කය
--------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 12 වන දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 මාර්තු 31 වන දින ද සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට මන්නාරම නගර සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශ ලේකම්ගේ 2014 ජනවාරි 27 දිනැති හා අංක පීඑල්/05/පීජ්/එස්එෆ්පිඑස්ජ්එස් දරණ චක්‍ර ලේඛය පරිදි රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

මූල්‍ය ප්‍රකාශන වල ගෙවිය යුතු මූල්‍ය කල්බදු ලෙස රු. 2,562,900 ක් දක්වා තිබුණු නමුත් ඊට අදාල ලේඛණ තුල ගෙවිය යුතු මූල්‍ය කල්බදු ලෙස
රු. 1,368,693 ක් ලෙස දැක්වීමෙන් රු. 1,692,707 ක මුදලක් වැඩිපුර මූල්‍ය ප්‍රකාශන තුල දක්වා තිබුණි.

1.3.3 නීති , රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම්
--------------------------------------------------

පහත දැක්වෙන නීති , රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගනණයේදී නිරීක්ෂණය විය.

| නීති , රීති හා රෙගුලාසි සඳහා යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| I. මුදල් රෙගුලාසි 371 | අවස්ථා 23 කට අදාල විවිධ වැඩකටයුතු සඳහා නගර සභාවේ නිළධාරීන් හා බාහිර පුද්ගලයින් වෙත ගෙවිය යුතු රු.1,715,404 ක් වටිනා අත්තිකාරම් වාර්ථාවේ දිනය දක්වා නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. |

| | |
|---|---|
| II. මුදල් රෙගුලාසි 571 | රු.1,258,887 ක් වටිනා පොදු තැන්පතු දිගු කාලයක සිට පොත් වල පෙන්වා ඇති නමුත් එය නිරවුල් කිරීමට කිසිදු පියවරක් ගෙන නොතිබුණි. |

(ආ) නගර සභා ආඥා පනත

| | |
|---|---|
| (255) 160 අධිකාරය | නගර සභා සීමාව තුල පවතින ඉඩම්, ගොඩනැගිලි හා ඉදිකල නිවාස වෙනුවෙන් ලැබිය යුතු රු.3,514,812 ක් වටිනා වරිපනම් බදු අයකර ගැනීමට 2015 වර්ෂ අවසානය දක්වා පියවර ගෙන නොතිබුණි. |

(ඇ) පළාත් මුදල් රීති

| | |
|---|---|
| 407 : 1 , 407 : 2 , 407 : 3 හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි ix වන අධිකාරයෙහි 01 වන කොටස (1989 අප්‍රේල් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය) | මුදල් හා ගබඩා කටයුතු භාරව කටයුතු කරන නිළධාරීන්ගෙන් ඇපකරයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 22,760,511 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 20,403,814 ක් විය. මේ අනුව රු. 2,356,697 කින් මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය වී තිබූ අතර රාජ්‍ය ප්‍රදාන ලැබීම් හා ආදායම් වැඩිවීම ඊට හේතු වී තිබුණි.

### 2.2 ආදායම් කළමණාකරණය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය

සභාව විසින් ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් අයවැය ගත කළ ආදායම හා සත්‍ය ආදායම අතර රු. 6,425,920 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 2.2.2 වරිපනම් බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභා බල ප්‍රදේශය තුල පවතින දුරකථන සම්ප්‍රේෂණ කුළුණු වලින් මාසික වරිපනම් බදු අයකර ගැනීමට කිසිදු පියවරක් සභාව විසින් ගෙන නොතිබුණි.

(ආ) ලැබිය යුතු රු. 4,957,869 ක් වටිනා වරිපනම් බදු අයකර ගැනීමට කිසිදු පියවරක් සභාව විසින් ගෙන නොතිබුණි.

2.2.3 මුද්දර ගාස්තු

---------------

රෙජිස්ටාර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙතින් 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අයවිය යුතු රු. 31,508,924 ක් වටිනා මුද්දර ගාස්තු අයකර ගැනීමට කිසිදු පියවරක් සභාව විසින් ගෙන නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

කාර්යසාධන වාර්තාව

--------------------------

මහා භාණ්ඩාගාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2010 මාර්තු 10 දිනැති හා අංක PF/R/2/2/3/5/(4) දරන ලිපියෙහි 1.4.1 වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාවක් සකස් කළ යුතු වුවත් සභාව විසින් ප්‍රවර්ථන වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාවක් 2016 අගෝස්තු 10 දින දක්වා පිළියෙල කර නොතිබුණි.

4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

4.1 විගණන හා කළමනාකරණ කමිටු

--------------------------------------

කළමනාකරණ හා විගණන දෙපාර්තමේන්තුවෙහි අංක DMA/2009/(1) දරණ හා 2009 ජූනි 09 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව එක් වර්ෂයක් සඳහා විගණන හා කළමනාකරණ රැස්වීම් 04 ක් වත් අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම සඳහා අවම වශයෙන් පැවැත්විය යුතු බව දන්වා තිබුණද මන්නාරම නගර සභාව විසින් ඉහත පරිදි විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

4.1 වත්කම් කළමණාකරණය

-----------------------------

4.1.1 වාහන භාවිතය

-----------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) නගර සභාව විසින් භාවිතා කරණු ලබන වාහන 15 ක් වෙනුවෙන් දෛනික ධාවන සටහන් 2015 ජූනි මාසයේ සිට 2015 දෙසැම්බර් මාසය දක්වා විගණනය වෙත ලබා දී නොතිබුණි.

(ආ) නගර සභාව විසින් භාවිතා කරණු ලබන වාහන 30 කට අදාලව අයිතිය නගර සභාව වෙත මාරු කර නොගැනීම මත ප්‍රවර්ථන වර්ෂය වෙනුවෙන් රක්ෂණ ආවරණ හා අදායම් බලපත්‍ර ලබා ගැනීමට විගණන දිනය දක්වා නොහැකි වී තිබුණි.

5. පද්ධති හා පාලන

-------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ආදායම් රැස්කිරීම්
(ආ) අයවැය පාලනය
(ඇ) ලැබිය යුතු ගිණුම්
(ඈ) ස්ථාවර තැන්පතු
(ඉ) අත්තිකාරම් රෙජිස්ටර් නඩත්තුව
(ඊ) වැය ලෙජර නඩත්තුව
(උ) නිළධාරීන්ගේ ආපදා ණය අයකර ගැනීමේ ලේඛණ නඩත්තුව